# අදිසි

11

ජගත් ජේ එදිරිසිංහ ලියයි

රණසිංහ මන්ත්‍රීවරයා ගේ වාහනය පන්සල් බිමට ඇතුළ් වන විට සෙදෝරිස් සිටියේ බණ මඩුව අමදිමින් ය. වාහනය ගේට්ටුව අසළ නතර වෙයි. රණසිංහ වාහනයෙන් බැස අලුත් තාප්පයත් පිලිසකර කළ මකර තොරණත් පරීක්ෂා කරන අතරේ සෙදෝරිස් අඩියට දෙකට ආවාස ගෙට ගොඩ වන්නේ පොඩි හාමුදුරුවන්ට පනිවිඩය කියන්නට ය.

දවල් දානයෙන් පසුව පොඩි හාමුදුරුවන් කියවමින් සිටි පුවත්පතත් අතැතිව හාන්සි පුටුව මත ම නින්දකට වැටී ඇත.

රණසිංහ ලොකු හාමුදරුවන් සමග කරන කතා බහට එහෙන් මෙහෙන් ඇහුම් කන් දුන් සෙදෝරිස් කැරකෙමින් සිටියේ කෙසේ හෝ පොඩි හාමුදුරුවන් අවදි කරවීමේ අරමුණෙනි. වරක් දෙවරක් උගුර පෑදූ නමුත් උන්වහන්සේ අවදි වන බවක් නොපෙනේ. හාන්සි පුටුව අසළටම ගොස් අත තිබූ කොස්ස බිම අත හරින්නේ එනිසා ය.

පොඩි හාමුදුරුවන් ඇස් ඇර බලන්නේ සෙදෝරිස් අත වූ කොස්ස දෙවෙනි වතාවට බිම වැටෙන හඬට ය.

"මං උන්න අපේ හාමුදුරුවො නිදි ය කියාල ..." සෙදෝරිස් වරදක් කර සමාව ඉල්ලන්නා සේ කියයි.

"නින්දක් යන්නයි ගියේ.." පොඩි හාමුදුරුවෝ පුවත්පත කනප්පුව මත තබා නැගිටියි. සෙදෝරිස් උන්වහන්සේ වෙත ළං වන්නේ වැදගත් යමක් කියන්නට ය.

"අන්න ඇවිල්ල ..."

පොඩි හාමුදුරුවන් සෙදෝරිස් දෙස බලන්නේ පැමිණ පොඩි හාමුදුරුවන් දෙපා වඳියි. ".. මං උන්නෙ ඔබ වහන්සෙ බැහැර වැඩලා කියලයි.. මං මේ අපේ හාමුදුරුවන්ට කිය කියා හිටියෙ බණ මඩුවෙ වහලෙ වැඩ ටිකත් ඉක්මණින්ම අහවර කරන්ඩ ඕනෙ කියලයි.. "

පොඩි හාමුදරුවන් හිස් අසුනේ වාඩි වී බුලත් වට්ටිය අතට ගනියි. බුලත් කොලයක් අතට ගෙන සීරුවෙන් හුණු ඉරක් ඒ මත ඇඟිල්ලෙන් අඳියි. තුනට හතරට නැවූ බුලත් කොළය අතේ තබාගෙනම රණසිංහ දෙස බලයි.

"හැබෑටම රණසිංහ මහත්තයා මං මේ අහන්නමයි කියලා උන්නෙ... මේ වැඩ වලට වියදම් කරන්නෙ ඔබතුමාගෙ මුදල් නෙවෙයි නේද..?"

රණසිංහ පිලිතුරක් නොදී සිනාසෙයි.

"ඇත්තටම මහත්තයට මේ වැඩ වලට සල්ලි දුන්නෙ කව්ද..?" පොඩි හාමුදුරුවෝ මුල් ප්‍රශ්නයම වෙනත් ස්වරූපයකින් අසති.

"කාගෙ සල්ලි වුණාම මොකද අපේ හාමුදුරුවනේ.. පන්සලේ තාප්පෙ අවුරුදු ගාණක් තිස්සෙ කඩා වැටෙනවා.. කව්රු හරි මේක හදන්නම ඕනෙ.. මොන ක්‍රමෙන් හරි දැන් ඒ වැඩේ කෙරුණා.. සල්ලි කාගෙ වුණත් ඒවා වියදම් වුණේ පින්කමකට.. මං හිතන්නෙ එච්චරයි"

ලොකු හාමුදුරුවෝ උගුරේ රැල් බුරුල් අරිති. ඒ පොඩි හාමුදුරුවන්ට නිශ්ෂබ්ද වන්නැයි කරන සංඥාවකි. පොඩි හාමුදුරුවන් අතේ තිබූ බුලත් කොළය මුවට ඔබා ගන්නේ ඒ සංඥාව වටහා ගන්නා නිසා ය.

"මහත්තයා හරි.. කාගෙ කාගෙ හවුලකින් හරි සාසනේ වෙනුවෙන් හොඳ යමක් කෙරුණා.. ඒ පින



"ඇත්තටම අපේ හාමුදුරුවනේ මාත් මේ වැඩෙන් හරිම සතුටක් ලැබුවා.. මේක අපේ පන්සල ... අපි මේක හදාගන්ඩ ඕනෙ.. හැමදාම ඒක මගේ හිතේ තිබුණා.. හිතේ තිබුණට ක්‍රියාත්මක කරන්ඩ ඉඩක් ආවෙ දැන් තමයි.. අපේ හාමුදුරුවො දන්නවනේ... ඡන්දයක් ආවාම තමයි සල්ලිකාරයෝ සල්ලි විසි කරන්නඩ පටන් ගන්නෙ.. මං කළේ ඒ විසි කරන සල්ලි වලින් වැදගත් වැඩක් කළ එක විතරයි.. මං අද ඉඳියි.. හෙට පරදියි ද කව්ද දන්නෙ..? ඒත් මේ වැඩේ තව කාලයක් තියේවි.. අඩුම ගානෙ අවුරුදු විස්සක් තිහක් වත්.. මට ඒ ඇති හාමුදුරුවනේ.."

ප්‍රශ්නාර්ථයක් රැඳුණ ඇසින් ය.

"රණසිංහ මන්ත්‍රී.."

පොඩි හාමුදුරුවන් කනප්පුව මත ඇති වතුර වීදුරුවෙන් කට සෝදා ගන්නේ සෙදෝරිස් ගෙන ආ ආරංචියෙන් කලබල වූ බවක් නොපෙන්වමිනි.

"පොඩ්ඩක් ගිහින් බැලුව නම් හොඳයි නේද අපේ හාමුදුරුවනේ..?" සෙදෝරිස් කියයි. ඒ ඉවසීමේ සීමාවටම ඉක්මවා ගිය නිසා ය.

"දෙන්නෙක් කතා කරන තැනකට අනාරාධිතව තුන්වැන්නෙක් යන එක සුදුසු දෙයක් නෙවෙයි ලොකු උන්නැහේ.."

"ඔය මළ උලව් චාරිත්තර නෙවෙයි.. ඔය යකාගෙ කපටි කතා වලට අපේ ලොකු හාමුදුරුවො රැවටෙනවා අපේ හාමුදුරුවනේ.. දකුණු අතිං එකක් දීලා වම් අතිං දෙකක් ගන්නයි ඔය ලෑස්තිය" සෙදෝරිස් කෝප ගන්වන්නට පොඩි හාමුදුරුවන්ට නොසිතෙයි. දුකට සැපට ළඟ සිටින හිතවතා ඔහු ය.

"මං තේ හදං එන්නං.." ආලින්දය දෙසට යන පොඩි හාමුදුරුවන් දෙස බලා සෙදෝරිස් කියයි.

පොඩි හාමුදුරුවන් දකින තමාගේ මුහුණේ ක්ෂණිකව ඇඳීයන නොපහන් බව සඟවා ගන්නට රණසිංහ විශාල උත්සාහයක් දරයි. අපහසුවෙන් මුහුණ මත ඇඳගත් සිනහව විසුළු බවක් පෙන්වයි.

"අපේ පොඩි හාමුදුරුවනේ.." රණසිංහ ඉදිරියට

මහත්තයට ලැබෙනවා.. හවුල් වුණ අයටත් ලැබෙනවා.. ඉතිං අද අපේ මහත්තයා මේ පැත්තෙ ආවෙ විසේස කාරණේකටද කිව්ව නං."

"ඇත්තටම අපේ හාමුදුරුවනේ මාත් මේ වැඩෙන් හරිම සතුටක් ලැබුවා.. මේක අපේ පන්සල ... අපි මේක හදාගන්ඩ ඕනෙ.. හැමදාම ඒක මගේ හිතේ තිබුණා.. හිතේ තිබුණට ක්‍රියාත්මක කරන්ඩ ඉඩක් ආවෙ දැන් තමයි.. අපේ හාමුදුරුවො දන්නවනේ... ඡන්දයක් ආවාම තමයි සල්ලිකාරයෝ සල්ලි විසි කරන්නඩ පටන් ගන්නෙ.. මං කළේ ඒ විසි කරන සල්ලි වලින් වැදගත් වැඩක් කළ එක විතරයි.. මං අද ඉඳියි.. හෙට පරදියි ද කව්ද දන්නෙ..? ඒත් මේ වැඩේ තව කාලයක් තියේවි.. අඩුම ගානෙ අවුරුදු විස්සක් තිහක් වත්.. මට ඒ ඇති හාමුදුරුවනේ.. මං මේක කළේ කිසිම දෙයක් බලාගෙන නෙවෙයි.. මගෙන් කෙරෙන්ඩ තිබුණ යුතුකමක් මං කළා... එච්චරයි.. මං ගිහින් එන්නං අපේ හාමුදුරුවනේ.. " රණසිංහ අසුනින් නැගිටියි. දොර අසළදී ඔහු ආපසු හැරී ලොකු හාමුදුරුවන් දෙස බලයි. "... මගේ ඡන්ද ව්‍යාපාරයේ අන්තිම රැස්වීම ළබන සුමානෙ අපේ හාමුදුරුවනේ.. සෙනසුරාදා.. ඔබ වහන්සෙ ඒ වෙලාවට වේදිකාවෙ මගේ ළඟින් ඉන්නවා නම් මට ඒ ඇති.. ඒක මට ලොකු ශක්තියක් අපේ හාමුදුරුවනේ.. මං ඔබ වහන්සෙට වඩින්න වාහනයක් එවන්නං"

ලොකු හාමුදුරුවන් පිළිතුරක් දෙන්නටත් පෙර රණසිංහ කඩිසර ගමනින් වාහනය වෙත යයි. ඔහුට නගින්නට කඩිසරව දොර ඇර දෙන අජිත්ගේ ඉනෙහි රැඳුණ පිස්තෝලය පොඩි හාමුදුරුවන්ට හොඳින් පෙනෙයි.

"ඔබ වහන්සෙ දැන් මොකද කරන්නෙ..?" පොඩි හාමුදුරුවෝ මකර තොරණ මැදින් මහ පාරට ගොඩවන වාහනය දෙස බලාගත්වන ම අසති.

පිළිතුරක් නැති තැන උන්වහන්සේ හැරී බලති. ලොකු හාමුදුරුවන් වමතින් මුඩු හිස අතගාමින් කල්පනාවක ය.

00000000

ගල් තලාව මතට පහළින් වැව් දිය මත පාවෙමින් සිටින සේරුන් රැන දෙස වින්ධ්‍යා බොහෝ වේලාවක සිට බලා සිටියි. වැව් දිය තලාව පිසගෙන හමා එන සුළඟ සුවදායක ය. ඒ සුළඟේ දැවටුණ තෙත බරිත සිසිලස දිවා හිරු එළියේ උනුසුම මකා දමමින් ගත දැවටෙයි.

බිම සකස් කරන සහ කොන්ක්‍රීට් මිශ්‍ර කරන යන්ත්‍ර වල ඝෝෂාව නොවී නම් මේ පරිසරය වචනයෙන් කිව නොහැකි තරම් සන්සුන් කමකින් වෙලී යනු නිසැක ය.

ඇස් පියා ගත් විට වැව් දිය රැළිති නගන සිලි සිලියට භාවනාවක යෙදෙන්නාක් මෙන් සවන් දිය හැකි ය. සිත නිවී සැනහී යන මේ සුන්දරත්වය සදා විඳගන්නට තිබේ නම් කෙතෙරම් අපූරුද?

කිසිවකු පැමිණ ඈ අසලින් සිට ගනියි. ඒ සුනන්ද බව වින්ධ්‍යා දනියි.

"මෙතන මේ තරම් ලස්සනයි කියල මං හිතුවෙම නෑ.." වින්ධ්‍යා කියන්නේ හිස ඔසවා සුනන්ද දෙස බලමින් ය. පහළ සිට උස් කෝණයකින් බලන විට සුනන්ද වඩාත් උස්ව පෙනෙයි. "මෙතන වාඩිවෙලා පොඩ්ඩක් බලා ඉන්න.. මට නං පැය ගාණක් හරි බලා ඉන්න පුලුවන්.."

"මට වෙලාවකට බය හිතෙනවා.." සුනන්ද වැඩ බිම බාර ඉංජිනේරුවරයා සමග යම්කිසි සාකච්ඡාවක නිරතව සිටින කුසල් දෙස බලමින් කියයි. "..මේ වැඩෙන් මේ සුන්දර කම නැති වෙයිද කියලා.." මේ විශාල ඉදිකිරීම මේ පරිසරයට හානියක් කරනු ඇතැයි යන සිතුවිල්ල ඔහුට ඇති වූයේ වැඩ බිමට පය තැබූ පළමු මොහොතේ දී ය

"මටත් ඒ බය තිබුණා.. ඒත් ප්ලෑන් එක ස්ටඩි කළාම බය නැති වුණා.." වින්ධ්‍යා තමා අසළ තිබූ නෙළුම් මල් ගොඩෙන් එක පොහොට්ටුවක් ගෙන පුබුදුවන අතර කියයි. මේ නෙලුම් කීපය ඇයට කඩා දුන්නේ සුනන්ද ය. ඔහු සිය අත පොවන මානයේ තිබූ නෙලුම් මල් කීපය ඇයට නෙලා දුන්නේ වැඩ බිමට ආ සැණින් වැව් දිය මත පිපී සැළෙණ නෙළුම් මල් යාය දැක ඈ එයින් වශී වී සිටි බව දුටු නිසා ය.

"කණ්ඩලම හෝටලේ හදන කාලෙත් මිනිස්සුන්ගෙ හිත් වල ඔය බයම තිබුණා සුනන්ද අයියා.. මතකද?" කුසල් වින්ධ්‍යා අසළින්ම ගල් තලාව මත වාඩි වෙයි. ".. මතකද සමහරු ගිණි තියාගන්නවා කියලත් කිව්වා.. ඒත් අන්තිමේ මොකද වුණේ.. දැන් එක්කෙනෙක් වත් ඉන්නවද ඒ හෝටලෙන් පරිසරය විනාශ වුණා කියන්න.. මාත් බින්දුවක් වත් කැමති නෑ මේ තියෙන ස්වභාව සෞන්දර්යයට එක අංශු මාත්‍රයකින්

අනෙක් පිටුවට